**ශීර්ෂය 194 - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 28 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. '

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මුල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 ඡේදයෙහි වාර්තාකරණ ආයතනය විසින්, වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරනු ලබන ආදායම, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් අමාත්‍යාංශය විසින් එකතු කරන ලද ආදායම් ලෙස රු.53,926,281 ක් දක්වා තිබුණද ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු දක්වා නොතිබුණි. | ACA 7 ආකෘතියේ 2020 වර්ෂයේ තොරතුරු සඳහන් කිරීමට ස්ථානයක් වෙන්කර නොමැති බැවින් එම වටිනාකම සටහන් නොකරන ලද බව කාරුණිකව පෙන්වා දෙමි. | මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**1.6.2 දේපළ පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයට අයත් වාහන 16 ක් වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය. අමාත්‍යාංශයට අනුබද්ධව පවතින නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 3ක් අදාල තක්සේරු අගයන්, දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා විද්‍යායතනය, ජාතික ක්‍රීඩා සභාව සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යන ආයතනවල මූල්‍ය නොවන වත්කම්ද (ඉඩම් හා ගොඩනැගිලි) තක්සේරු කර ගිණුම් ලත කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හි 4.10 ඡේදය පරිදි මෙලෙස වත්කම් උඩුගත කිරීමට ලබා දී තිබූ අවසන් දිනය 2022.02.03 ය. එබැවින් අවශ්‍ය සංශෝධනයන් 2021.12.31 දිනට සිදු කිරීමට නොහැකි විය.<br>නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 03 කට අදාල තක්සේරු අගයන් දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන තෙක් නාමික අගයක් ලෙස CIGAS වැඩ සටහනෙහි රු.300ක් ලෙස ගිණුම් ගත කර ඇත. නමුත් මේ දක්වා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එම නිවැරදි | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිවැරදිව හා අප්‍රමාදව ගිණුම් පිළියෙල කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | වටිනාකම් නොලැබීම මත CIGAS වැඩ සටහනෙහි වූ තොරතුරු සංශෝධනය කිරීමට නොහැකි වී ඇති බව පෙන්වා දෙමි.<br>දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා විද්‍යාතනය, ජාතික ක්‍රීඩා සභාව, නුවරඑළිය ක්‍රීඩා නිවහන හා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යන ආයතනවල මූල්‍ය නොවන වත්කම් (ඉඩම් හා ගොඩනැගිලි) තක්සේරු කිරීමේ කටයුතු අවසන් වූ පසු එම ආයතනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සිදු කිරීමට නියමිතය. | |
| (ආ) | ජාතික සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් රු.50,000,000 ක් වූ ක්‍රීඩා හෝටලය අංක 61111 (හොටෙල් ඇන්ඩ් රෙස්ටුරන්ට්) යටතේ දක්වා තිබුණු අතර ඒ අනුව එම ප්‍රමාණයෙන් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂවලදී නිසි පරිදි වත්කම් සමාලෝචනයක් නොකිරීම මත සහ අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතන වෙනස් වීම මත පෙර අමාත්‍යාංශය යටතේ පැවති සුගතදාස අධිකාරියට අයත් ක්‍රීඩා හෝටලය වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ගිණුම් ගත කරන ලද වත්කම් වේ. මෙය රාජ්‍ය අමාත්‍යාංශයට පවරා දීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | නියමිත පරිදි වත්කම් කළමනාකරණය හා නිවැරදිව ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |

**1.6.3 කුලී වැඩ හා අත්තිකාරම් ගිණුම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------- | ----------- |
| අංක 250/2016 (i) හා 2016 අගෝස්තු මස 03 දිනැති රජයේ ගිණුම් චක්‍රලේඛයේ 05 හා 06 ඡේද පරිදි අත්තිකාරම් සම්බන්ධයෙන් රජය සතු හිමිකම ජනරජ ගිණුමෙන් පෙන්නුම් කරන බැවින් ඒ සඳහා වන කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් ඒසීඒ 5 (ඒ) ආකෘතිය හා 5 (බී) ආකෘති මගින් දැක්විය යුතු වුවද, ව්‍යාපෘති 02 ක් සඳහා ගෙවා තිබුණු රු. 19,065,178 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.15,753,731 ක් අත්තිකාරම් ගිණුමේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | අනෙකුත් ව්‍යාපෘති දෙකේ පවතින ශේෂයන් කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමක හා සංචිත ගිණුමක 2022 වර්ෂයේදී ගිණුම් ගත කිරීම සඳහා 2022 වර්ෂයේදී කුලී වැඩ අත්තිකාරම් ගිණුම් විවෘත කළ හැකිද යන්න රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය පරිදි ගිණුම් තැබීම සිදුකල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.'

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැය විෂයයන් **18** ක එකතුව රු.**1**,073,050,**078** ක් වූ ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණු බව නිරීක්ෂණය විය**.** | නිල ඇඳුම් සඳහා සුදුසුකම්ලත් සේවක මහත්ම මහත්මීන් නොමැති වීම සහ Covid – 19 ව්‍යාප්තිය හේතුවෙන් බොහෝමයක් රැස්වීම් Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීම නිසා සංග්‍රහ වියදම් දැරීමට සිදු නොවීම, පළාත් පාලන ආයතන හා බදු කල් ගෙවීම් අවශ්‍යතා ඇති නොවීම, දේපළ ණය ලබා නොගත් නිලධාරීන් සිටීම මත මෙම වියදම් දැරීමට සිදු නොවීම, පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ වැඩ සටහනේ දායක මුදල් ගෙවීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම, ප්‍රාග්ධන ස්වරූපයේ වාහන අලුත් වැඩියා අවශ්‍යතා ඇති නොවීම නිසා, බිල්පත් නිසි පරිදි ඉදිරිපත් නොවීම, විදේශ ගමන් සීමා කිරීම නිසා මෙම වියදම් දැරීමට අවශ්‍ය නොවීම. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.11,280,304 ක් වූ ඉතිරිවීම් එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 99 දක්වා පරාසයක පැවැතුණි. | එක් එක් වැය විෂයේ අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම, කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල අඛණ්ඩව පවත්වාගෙන නොයාම නිසා විවිධ වියදම් අවශයතා ඇති නොවීම, කාර්යාල අළුත්වැඩියාව මූලධන ප්‍රතිපාදන යටතේ සිදුකිරීම. | -එම **-** |

## 2.2 බැරකම් හා බැඳීම්වල එලඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ අංක 06 හි 3.4 | ප්‍රතිපාදන පවතින වැය විෂයන් වලට අදාලව පමණක් CIGAS වැඩ සටහනට බැරකම් ලෙස අගයන් ඇතුලත් කල යුතු බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇති | බැඳීම් වලට එලඹීමේදී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| ඡේදය අනුව සටහන් අංක (iii) යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමග සැසඳී තිබිය යුතු වුවද සටහන අංක iii යටතේ වූ බැදීම් හා බැරකම් ප්‍රකාශය හා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලැබූ බැදීම් හා බැරකම් ප්රකාශය අතර වැය විෂයයන් 06 කට අදාලව රු.180,920ක් වැඩියෙන් හා විෂයයන් 49 කට අදාළව රු.854,967ක් අඩුවෙන් දක්වා තිබුණි. | බැවින් ප්‍රතිපාදන පවතින වැය විෂයන් පමණක් CIGAS වැඩ සටහනේ බැරකම් ලෙස පෙන්නුම් කලද අදාල සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශණ වල පෙන්නුම් කල යුතු බැවින් සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශණයේ සටහන් අංක (iii) යටතේ ඇතුලත් කර ඇත. | |
| (ආ) මූල්‍ය ප්‍රකාශනය සමග ඉදිරිපත් කර තිබුණු බැදීම් හා බැරකම් ප්‍රකාශයේ (සටහන iii), 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.2,180,969ක බැරකම්, බැරකම් නිදහස් කිරීම් යටතේ දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී එම බැරකම් ශේෂයක් ලෙස ඉදිරියට ගෙන ඒමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.මෙවැනි අතපසු වීම් ඉදිරියේදී සිදු නොවන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | නිවැරදිව ගිණුම් ගත කල යුතු වීම. |

**2.3** තැන්පතු

------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------- | ----------------------------------- | ---------- |
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු පිළිබඳව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු වුවද, තැන්පත් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 06 සිට 02 දක්වා හා රු.33,629,309 ක් වූ තැන්පතු 39 ක් සම්බන්ධයෙන් 2022 මාර්තු 04 දින වන විටද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | වර්ෂ 02ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු සිදු කරනු ලබන බව. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**2.4 බැංකු ගිණුම් මෙහෙයවීම**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් අංක 7040742 දරන බැංකු ගිණුමට අදාලව නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්ම වූ එකතුව රු.790,512 ක් වටිනා චෙක්පත් 76 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චෙක්පත් 28ක් සඳහා හිලවු චෙක්පත් නිකුත් කර චෙක්පත් 08ක් නිරවුල් වී ඇත. ඉතිරි චෙක්පත් සඳහා අදාල අංශ ලිපි මඟින් දැනුවත් කලද මේ වන තුරුත් ගෙවීම් සඳහා ඉදිරිපත් වී නොමැති බැවින් ඒ සඳහා මු.රෙ. 396 ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්ය සාධනය**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ක්‍රීඩා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම** අභිමානවත් තුලිත පෞරුෂත්වයකින් යුතු ජව සම්පන්න , තරුණ ප්‍රජාවක් හා ජවසම්පන්න නිරෝගීමත් විනය ගරුක සමාජයක් බිහි කිරීම සඳහා ක්‍රියාශීලි පරපුරක් නිර්මාණය කිරිමට "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අනුකූලව අංක 2187/27 දරණ හා 2020 අගෝස්තු 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් තරුණ ප්‍රජාව කේන්ද්‍ර කර ගනිමින් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය ස්ථාපිත කර තිබුණි. ඒ අනුව මෙම අමාත්‍යාංශය නියමිත නීති හා අණපනත් වලට අනුකූලව තරුණ හා ක්‍රීඩා විෂයට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සිදු කළ යුතු නමුත් 2022 මැයි 19 වන විගණන දිනට | අංක 1758/23 හා 2012 මැයි 16 දින අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් "ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය " ප්‍රකාශයට පත් කර ඇත. මෙම ක්‍රීඩා ප්‍රතිපත්තිය ඉදිරිපත් කර මේ වන විට වසර 10ක් ගත වී ඇති අතර ඒ අනුව කාලීනව ක්‍රීඩා ප්‍රතිපත්තිය යාවත්කාලීන කල යුතු බව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හඳුනාගෙන ඇත. මෙම ක්‍රීඩා ප්‍රතිපත්තිය සකස් කිරීමේදී දැනට ක්‍රියාත්මක වන 1973 අංක 25 දරණ ක්‍රීඩා පණත සහ එහි සංශෝධන පණත්ද සැලකිල්ලට ගෙන ක්‍රීඩා ප්‍රතිපත්තිය සකස් කල යුතු බව අමාත්‍යාංශයේ අදහස වේ. ඒ අනුව තත්කාලීන ක්‍රීඩා පනත සහ ඒ යටතේ කලින් කල නිකුත් කරණ ලද ක්‍රීඩා නියෝග , ක්‍රීඩා රෙගුලාසි ඇතුළත්ව සංශෝදනය කිරීමට මේ වන විටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය සකස් | ක්‍රීඩා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව නගා සිටුවීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සම්මත කර ගත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව නගා සිටුවීම උදෙසා ස්ථාපිත කර නොතිබුණි. | කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් කමිටුවක් පත් කර ඇත. ඒ අනුව ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගේ හා විද්වතුන්ගේ අදහස් ලබා ගැනීමට අදහස් කරණ අතර ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම, ක්‍රීඩා පණත හා ක්‍රීඩා රෙගුලාසි සමඟ සමාන්තරව සලකා බැලීම පිළිබඳව අවධානය යොමු කර ඇති බවටත් වැඩි දුර සඳහන් කරමි. | |
| (ආ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටලු සහිත අවස්ථා නිරාකරණය වන ලෙස පනත සංශෝධනය කිරීමට හා යාවත්කාලීන කිරීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබීම. | ක්‍රීඩා පණත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මූලිකවම දැනට වලංගුව පවතින ක්‍රීඩා නියෝග තනි ගැසට් නිවේදනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සකස් කරන ලද කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට 2022.03.16 දින යොමු කොට ඇත. එසේම එම නියෝග පදනම් කර ගනිමින් පවතින ක්‍රීඩා පණත වර්තමානයට ගැලපෙන පරිදි සංශෝදන කිරීම සඳහා විශ්‍රාමික නීති කෙටුම්පත් සම්පාදක සිරි මැදවැව මහතා වෙත 2022.04.25 දින අදාල සියළු ලේඛන සමඟ යොමු කොට ඇත. | ක්‍රීඩා පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටලු සහිත අවස්ථා නිරාකරණය වන පරිදි පනත සංශෝධනය කිරීමට හා යාවත්කාලීන කල යුතු වීම. |
| (ඇ) | ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් රු. මිලියන 1,622 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන රු. මිලියන 37ක් වියදම් කර තිබුණු ව්‍යාපෘති 5ක් නිම නොකර අත්හිටුවා දමා තිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන නොමැති වීම නිසා හා කොවිඩ් වසංගතය හේතුවෙන් ව්‍යාපෘති අත්හිටුවා ඇත. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර නියමිත කාලරාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්.** | | |
| | රු. මිලියන 1,049 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන රු. මිලියන 143 ක් වියදම් කර තිබුණු ව්‍යාපෘති 11ක ඉටු කිරීමේ ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියට වැය වන සම්පූර්ණ පිරිවැය සැලකීමේදී හා එවැනි මධ්‍යස්ථාන නඩත්තු කිරීමේදී වැය වන පිරිවැයද සලකා බලා මෙම ව්‍යාපෘති අත්හිටුවීමට තීරණය කරන ලද අතර,ආනයනික සීමා හේතුවෙන් ණයවර ලිපි විවෘත කිරීම ගැටළු සහගත වීම, කොන්ත්‍රාත්කරු නිසි පරිදි කාර්යයන් සම්පූර්ණ නොකිරීම නිසා කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට තීරණය කිරීම, නැවත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම හා ප්‍රතිපාදන නොමැති වීම නිසාද ඇතැම් ව්‍යාපෘති අත්හිටුවීමට තීරණය කර ඇත. | ඉදිකිරීම් සඳහා නියමිත කාලරාමුව නිවැරදිව සැලසුම් කළ යුතු වීම හා නිවැරදිව සැලසුම් කළ කාර්යභාරයන් නිමකර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය හා නියාමනය කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ඉ)** | **ග්‍රාමීය ක්‍රීඩා පිටි ඉදිකිරීම.**<br>වැය විෂයය අංක 194-2-4-14-2506 යටතේ ග්‍රාමීය ක්‍රීඩා පිටි ඉදිකිරීම සඳහා රු.මිලියන 500ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම ව්‍යාපෘති ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘතියේ විස්තර සඳහන් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.436,494,396 ක් වැය කර රු.63,235,961 ක් ඉතිරි වී තිබුණි. එක් එක් ව්‍යාපෘතියේ කාර්ය ප්‍රගතිය පිළිබඳ විස්තර තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා නොතිබුණු අතර එම ව්‍යාපෘති වල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ග්‍රාමීය ක්‍රිඩා පාසල් වල යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහනේ ප්‍රගතිය 2021.09.30 දින ප්‍රගති වාර්තාවට ඇතුළත් කර ඇත. විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි 2021 වාර්ෂික කාර්ය සාධන වාර්තාවට එම වැඩ සටහනේ ප්‍රගතිය ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත. | ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු කලමනාකරණය සහ නියාමනය සිදු කල යුතු වීම. |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 751 ප්‍රකාර සියළු වත්කම් ලේඛනගත කල යුතු බව දක්වා තිබුණද අමාත්‍යාංශය සතු 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු. 12,129,876 ක් වූ 630 KVA Sound Proof ජෙනරේටරය වත්කම් ලේඛනයෙහි ඇතුලත් කර නොතිබුණි. | 2021.12.31 CIGAS මගින් ලබා ගන්නා වත්කම් රෙජිස්ටරයේ පිටුව 175 හි විද්‍යුත් උපාංග අයිතමය යටතේ රු.1,285,000ක් වශයෙන් විදුලි ජනක යන්ත්‍රය ගිණුම් ගත කර ඇත. | රෙගුලාසි ප්‍රකාරව වත්කම් නිවැරදිව ලේඛන ගත කල යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ එයට අයත් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සහ නායකත්ව ජාතික මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 15 ක් ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 33 ක්ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 91 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 51 ක් ඇතුළු මුළු පුරප්පාඩු සංඛ්‍යාව 190 ක් පැවතුණි. එම පුරප්පාඩු තුළ අමාත්‍යාංශයේ කාර්ය සාධනය කෙරෙහි බෙහෙවින් වැදගත්වන අධ්‍යක්ෂ තනතුරු 06 ක්, සහකාර අධ්‍යක්ෂ 06 ක් හා කළමනාකරණ සේවා නිලධාරීන් 40 ක් ඇතුළු සේවක ඌනතාවයන් පැවතුණි. | මෙම අමාත්‍යාංශයේ සහ මෙම අමාත්‍යාංශය යටතේ ස්ථාපිතව ඇති කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙහි හා ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ පහත වගුවේ සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීම පිණිස එවක රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති බවත් ඒ සම්බන්ධව වරින්වර ඉල්ලීම් කර ඇති බවත් කාරුණිකව දන්වමි.<br><br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අනෙකුත් තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම පිණිස නැවතත් ඉල්ලීම් කර ඇති බවත් දන්වනු කැමැත්තෙමි. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන හිග කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය |